සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

විෂය - නර්තනය

සතිය - සැප්. 02

ශ්‍රේණිය - 10

3 වාරය

1) නිපුණතාවය - 2. නර්තනය හා බැඳුණු මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.

2) නිපුණතා මට්ටම - 2.5 නර්තන කලාව හා සබැඳි ප්‍රකාශන විධික්‍රම අධ්‍යනය කරමින් අදහස් දක්වයි.

3) පාඩම හෝ ඒකකය - 2:5:1 සතර අභිනය

4) ඉගෙනුම් ඵල -

- ''අභිනය'' යන්න අර්ථ දක්වයි.
- අභිනයහි කොටස් හතර නම් කරයි.
- ඒ ඒ අභිනය කවරේදැයි අවබෝධ කොට ගෙන උදාහරණ සපයයි.
- ඉගෙන ගත් ශාන්ති කර්ම ආශ්‍රිතව භාවිතාවන අභිනයන් පිළිබඳව වටහාගනියි.
- අභිනය මැනවින් භාවිතයට ගනිමින් කෙටි සිදුවීමක් ගෙන හැර දක්වයි.

5) ශිෂ්‍යයා කළ යුතු කාර්යයන් -

- අභිනය පිළිබඳව ඇති සටහන කියවීම.
- ඊට අදාළ පුවත්පත් ලිපි, තොරතුරු පත්‍රිකා කියවයි.
- සතර අභිනය පිළිබඳව තොරතුරු රැස් කරයි.

6) උපයෝගී කර ගත හැකි පොත්පත්, web site, LMS පාඩම් හා ඉගෙනුම් ආධාරක.

- e- තක්සලාව - https://www.e-thaksalawe.mo.go.lk
- e- නැණ පියස - Course : 10 වසර නර්තන කලාව

**කියවීම් පත්‍රිකාව**

අභිනය යනු සංස්කෘත භාෂාවේ එන වචනයකි. සිංහලෙන් එය අදහස් ප්‍රකාශ කිරීම ලෙස අර්ථ දැක්විය හැකිය. භරතමුනිගේ ''නාට්‍ය ශාස්ත්‍රයේ'' අභිනය යන්න නිර්වචනය වන්නේ, 'ඉදිරියට ගෙන ඒම' යන අර්ථයෙනි. නර්තනයේදී හා රංගනයේදී (නාට්‍යවලදී) අභිනය භාවිත කෙරේ. අභිනය සාර්ථකව භාවිත කිරීම මගින් නර්තන හා නාට්‍ය කෙරෙහි ප්‍රේක්ෂකයා ඇඳ බැඳ තබා ගත හැකිය. අභිනය සිව් වැදෑරුම් ය.

1. ආංගික අභිනය

   අංග, ප්‍රත්‍යංග, උපාංග ලෙස සිරුරේ ඇති කොටස් මගින් අදහස් ප්‍රකාශ අදහස් ප්‍රකාශ කිරීම වේ.

2. වාචික අභිනය

   පද්‍ය, ගීත, සංවාද මගින් අදහස් ප්‍රකාශ කිරීමයි.

3. සාත්ත්වික අභිනය

   මුහුණේ ඉරියව් මගින් අදහස් ප්‍රකාශ කිරීම මෙන්ම වෙවුලීම, කඳුළු සැලීම, දහදිය දැමීම ආදිය ද සාත්ත්වික අභිනයට අයත් වේ.

4. ආහාර්ය අභිනය

   රංග වස්ත්‍රාභරණ, වේදිකා සැරසිලි, වේදිකා ආලෝකකරණය ආදී මගින් අදහස් ප්‍රකාශ කිරීම ආහාර් අභිනය යි.

**කාර්ය පත්‍රිකාව**

1. අභිනය කෙටියෙන් හඳුන්වන්න.
2. අභිනය පිළිබඳ අදහස් දක්වා ඇති භාරතීය රස වාදීන් කවුරුන්ද?
3. අභිනය කොටස් කීයද?
4. ඒ මොනවාද?
5. ඒවා කෙටියෙන් හඳුන්වන්න.
6. එක් එක් අභිනයට උදාහරණයක් බැගින් දක්වන්න.
7. සතර අභිනය භාවිතයෙන් ඇති වාසි මොනවාද?
8. ඔබ නරඹා ඇති රූපවාහිනී නර්තන අංගයක හෝ වේදිකා නාට්‍යයක සතර අභිනය යොදා ගන්න ඇති අයුරු විමසන්න.
9. පාසල් වේදිකාවට සතර අභිනය යොදා ගනිමින් ඔබ නර්තන අංගයක් ඉදිරිපත් කරන් අයුරු පහදන්න.

7) අතිරේක පොත් පත් -

- ❖ 10 ශ්‍රේණිය නර්තනය - ශ්‍රද්ධානසිරි පීරිස් මහතා.
- ❖ 10 ශ්‍රේණිය අතිරේක කියවීම් පොත - සෞන්දර්ය අධ්‍යාපන ආයතනය